(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 43.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2009 දෙසැම්බර් මස 08 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0217/’09

1.

ගරු ජේමසිරි මානගේ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2009 ජනවාරි මාසය තුළ දී ජපන් රජයේ විශේෂ නියෝජිත යෂූෂි අකාශි මහතා ශ්‍රී ලංකාවට පැමිණියේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යෂූෂි අකාශි මහතා ශ්‍රී ලංකාවට පැමිණියේ ශ්‍රී ලංකා රජයේ ආරාධනයක් මතද;

(ii) එසේ නම්, එලෙස ආරාධනා කළේ කවුරුන් විසින්ද;

(iii) ඒ මහතා ඉහත පාර්ශ්වයන් සමග සාකච්ඡා කළ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0284/’09

2.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— ජාතිය ගොඩනැගීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 2004 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා සෑම වර්ෂයකම ජූනි මස 30 වැනි දිනට හිමිකම් ලබමින් සිටින සමෘද්ධිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ හිමිකම් ලද අයට ගෙවන ලද මුදල් ප්‍රමාණයන්, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) 2004, 2005, 2006 සහ 2007 වර්ෂවල සමෘද්ධිලාභීන්ට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වර්ෂ තුළ සමෘද්ධිලාභීන් වශයෙන් සිටි එහෙත් පසුව ඉන් ඉවත් කරන ලද සංඛ්‍යාව සහ එම අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එසේ ඉවත් කරන ලද්දේ කවර පදනමක් යටතේද;

(iii) අලුතින් එක් වූ සමෘද්ධිලාභීන් සිටීනම්, එම අයට ගෙවූ මුදල් ප්‍රමාණය සහ ඔවුන්ගේ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0365/'09

3.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2007 - 2008 වසරවලදී පොලිස් දෙපාර්තමේන්තුව විසින් අලුතින් ආරම්භ කරන ලද පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොලිස් ස්ථාන අතුරින්, උතුරු නැගෙනහිර ප්‍රදේශවල අලුතින් ඉදි කරන ලද පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පොලිස් ස්ථානවල ඉදි කිරීම් කරන ලද සමාගම් කවරේද;

(ii) අදාළ සමාගම් වෙත ඉදිකිරීම් භාර දීමට ටෙන්ඩර් කැඳවීමක් කළේද;

(iii) ටෙන්ඩර් අනුව ඉදිකිරීම් සිදුකර භාර දෙන ලද පොලිස් ස්ථාන හා ඉදිකිරීම් සිදුකළ සමාගම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එකී සමාගම් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් මේ වන විට කරන ලද ගෙවීම් ප්‍රමාණය කොපමණද;

(v) අලුතින් පොලිස් ස්ථාන ඉදිකිරීම් සඳහා නොගෙවා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) එකී ගෙවීම් කරනු ලබන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0419/'09

4.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පල්ලෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ග වල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 වර්ෂයේ දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණ කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0513/’09

5.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ගා/තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 35 ඉඩමේ මේ වන විට කොපමණ පිරිසක් අනවසරයෙන් පදිංචිව සිටීද;

(ii) එම පදිංචිකරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) ඔවුන් කොපමණ කාලයක සිට එම ඉඩමේ පදිංචිව සිටීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ගම්මානයට මාර්ග පහසුකම් සහ විදුලි බලය ලබා දී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) දීර්ඝ කාලයක සිට මෙම පදිංචිකරුවන් නිවාස සාදාගෙන, වගා කටයුතු කරගෙන සිටින බැවින් කොපමණ කාල සීමාවක් තුළ ඔවුන්ට එම ඉඩම් සඳහා ඔප්පු ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0550/’09

6.

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දුරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දුරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දුරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දුරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම්, එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල වැයකර ඇත්තේ කවර කටයුතු සඳහාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0633/'09

7.

ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ ඒ පොලිස් ස්ථාන සතුව ඇති (පාවිච්චි කළ හැකි) ජීප් රථ, ට්‍රක් රථ හා මෝටර් සයිකල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් පොලිස් ස්ථානය සඳහා 2009 වර්ෂයේ මුල් මාස 6 තුළ ඉන්ධන සඳහා ලබාදුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2008 වර්ෂයේ මුල් මාස 6 සඳහා එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0645/'09

8.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දෙහිවල සත්වෝද්‍යානය හා සම්බන්ධව පැන නැගී ඇති සිද්ධි පරීක්ෂා කිරීමට කමිටුවක් පත් කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006, 2007 හා 2008 වර්ෂයන්හි මියගිය සතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත වර්ෂවල සත්වෝද්‍යානයට අලුතින් එකතු කරන ලද සතුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) දෙහිවල සත්වෝද්‍යානය සතු භූමි ප්‍රමාණය කොපමණද;

(ii) සත්වෝද්‍යානයේ දෛනික හා වාර්ෂික ආදායම් හා වියදම් වෙන වෙනම කවරේද;

(iii) සත්වෝද්‍යානය සඳහා පශු වෛද්‍යවරුන් කොපමණ සංඛ්‍යාවක් අවශ්‍යවේද;

(iv) දැනට සිටින පශු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) සත්වෝද්‍යානය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) සත්වෝද්‍යානය සඳහා දැනට අවශ්‍ය සහ අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ වාර්තාවක් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) සත්වෝද්‍යානය වැඩි දියුණුකර ගැනීමට ගන්නා පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0709/'09

9.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වසර 10 ට අදාළව,

(i) රජයේ ඇස්තමේන්තුගත ආදායම හා සත්‍ය ආදායම කොපමණද;

(ii) රජයේ ඇස්තමේන්තුගත වියදම, පුනරාවර්තන හා ප්‍රාග්ධන අනුව වෙන් වෙන් වශයෙන් සහ සත්‍ය වියදම වාර්ෂික පදනමින් කොපමණද;

(iii) ඇස්තමේන්තු ගත අයවැය හිඟය සහ සත්‍ය අයවැය හිඟය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අපේක්ෂා කරන ලද ආදායම සහ සැබෑ ආදායම අනුව අයවැය හිඟය පියවන ලද්දේ කෙසේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පසුගිය වසර 10ට අදාළව, වර්ෂිකව රටේ දළ දේශීය නිෂ්පාදිතය (GDP) අඛණ්ඩ පදනමින් හා මූර්ත මුදල් පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0756/'09

10.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2003 වර්ෂයේ එවකට ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා මැලේසියාවේ සංචාරය කළ අවස්ථාවේ, කොළඹ මහනුවර අධිවේගී මාර්ගය ඉදිකිරීමට මැලේසියානු සමාගමක් සමඟ ගිවිසුමක් ඇති කර ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සන්ධාන රජය බලයට පත් වී අවුරුදු 05 ක් ගත වී ඇතත් මෙම මාර්ගය ඉදිකිරීමට කිසිදු පියවරක් නොගැනීමට හේතු කවරේද;

(ii) මේ සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0224/'09

11.

ගරු පේමසිරි මානගේ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "පෙතඩීන්" එන්නත් මෙරටට ගෙන්වීමට ඇණවුම් කළේ කවදාද;

(ii) ඒ කොපමණ ප්‍රමාණයක්ද;

(iii) "පෙතඩීන්" එන්නත් රජයේ රෝහල්වලට ලබාදීම ආරම්භ කළේ කවදාද;

(iv) "පෙතඩීන්" එන්නත් භාවිත නොකර ඉතිරිව තිබෙන ප්‍රමාණය කොපමණද;

(v) "පෙතඩීන්" එන්නත් අපතේ යාමෙන් සිදුවූ මූල්‍යමය පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "මොපීන්" එන්නත් මෙරටට ගෙන්වීමට ඇණවුම් කළේ කවදාද;

(ii) ඒ කොපමණ ප්‍රමාණයක්ද;

(iii) "මොපීන්" එන්නත් රජයේ රෝහල්වලට බෙදාහැරීම ආරම්භ කළේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0445/'09

12.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල, පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහවැලි අධිකාරියට සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් සමස්ත වැව් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැව්වලට අයත් රක්ෂිත ඉඩම් ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම රක්ෂිත ඉඩම් හඳුනාගැනීම සඳහා අවසන් වරට මිනුම් කටයුතු සිදු කර ඇති වර්ෂය කවරේද;

(iii) මෙම රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන් සිටීද;

(iv) එසේනම්, ඔවුන් පදිංචිව සිටින්නේ කවර හෝ නෛතික පදනමක් මතද;

(v) එසේනම්, ඒ පදනම හා කාලසීමාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0627/'09

13.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 1980 ජූලි වැඩ වර්ජනයට සම්බන්ධ වූ පේෂ කර්මාන්ත සේවකයන්ගේ හිඟ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් එවකට සිටි කම්කරු සබඳතා සහ විදේශ රැකියා නියුක්ති අමාත්‍යතුමා අංක 06/1540/230/039 හා 2006.08.18 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගේ නිරීක්ෂණය මත අමාත්‍ය මණ්ඩලය එම පත්‍රිකාව අනුමත කරමින් අදාළ ගෙවීම් කරන ලෙස කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යාංශයට (පෙර, කම්කරු සබඳතා හා විදේශ රැකියා නියුක්ති) උපදෙස් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) ඒ අනුව, 2006 දෙසැම්බර් මස මුල් භාගයේදී ගෙවීම් කරන බවට කම්කරු කොමසාරිස් ජනරාල් විසින් නිවැරදි හිමිකරුවන් හඳුනාගෙන, ගෙවීම් කිරීම පිණිස හිඟ වැටුප සඳහන් විශේෂ දිවුරුම් ප්‍රකාශ නිකුත් කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ වැටුප් ගෙවීමට ඇති දිවුරුම් ප්‍රකාශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) (i) ඒ අනුව, අදාළ පේෂකර්ම සේවකයන්ගේ හිඟ වැටුප් ගෙවීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0731/'09

14.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද බස්නාහිර පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0479/'09

15.

ගරු පේමසිරි මානගේ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දෙවිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, මාතර - කතරගම ප්‍රධාන මාර්ගය හා සම්බන්ධ කපුගම පුරන් වූ වෙල්යායේ කොටසක් ගොඩ කර හෝටලයක් ඉදිකර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කපුගම පුරන් වූ වෙල්යායේ කොටසක් ගොඩ කිරීමට අවසර ලබා දුන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

(iii) පුරන් වූ වෙල්යායන් ගොඩ කිරීමට අවසරදීම මහින්ද චින්තනයේ ප්‍රතිපත්තිවලට අනනුකූල නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් කළ භූමියේ හා හෝටලයේ හිමිකරුගේ නම හා ලිපිනය කවරේද;

(ii) එම ගොඩකිරීම හා හෝටලය ඉදිකිරීම නීති විරෝධී නම් ඊට එරෙහිව පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ කවර කාලයක් තුළ ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යතුමිය,—ජාතික කාන්තා කොමිෂන් සභාව,— කාන්තා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, ගරු කිරීම, වැඩිදියුණු කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාවක් පිහිටුවීම ද, කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ ජාත්‍යන්තර සම්මුතීන් සහ ප්‍රමිතීන් පිළිබඳ විධිවිධාන බලාත්මක කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

2.

කම්කරු සබඳතා සහ මිනිස් බල අමාත්‍යතුමා,—ජාතික සේවක අධ්‍යයන ආයතන,— ජාතික සේවක අධ්‍යයන ආයතනයක් පිහිටුවීම සඳහා ද, එම ආයතනයේ පරිපාලනය සඳහා පාලක මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද, තාක්ෂණ කමිටු පිහිටුවීම සඳහා ද, වෘත්තීය සමිති පාසලක් පිහිටුවීම සඳහා ද පර්යේෂණ පැවැත්වීම, සමීක්ෂණ පැවැත්වීම හා ශ්‍රී ලංකාවෙහි කම්කරු අධ්‍යාපනය ප්‍රවර්ධනය අරභයා පුහුණුව සැපයීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

3.

ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,—ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන,— ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශක සභාව සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම සඳහා ද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා ද; ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය කිරීම සඳහා ද, ඉදිකිරීම් කර්මාන්තයේ සම්පූර්ණ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. හා. 9.30 සිට අ. හා. 4.30 දක්වා විය යුතු ය. අ. හා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

6.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2010 ජනවාරි මස 05 වැනි අඟහරුවාදා පූ. හා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

7.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන ව්‍යසනයන් පරීක්ෂා කර බලා ඒවා වැළැක්වීම පිණිස ගතයුතු පියවර නිර්දේශ කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— 2006 ජුලි මස 20 වැනි දින ගරු කථානායකතුමා විසින් පත් කරන ලද මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන ව්‍යසනයන් පරීක්ෂා කර බලා ඒවා වැළැක්වීම පිණිස ගතයුතු පියවර නිර්දේශ කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවට, තමා විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු 2009 ජුනි මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මගින් නියම කර ඇති කාල සීමාව ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට නොහැකි බැවින් එම කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව අංක 96 දරන ස්ථාවර නියෝගය ප්‍රකාරව 2010 මාර්තු මස 31 වැනි දින දක්වා දීර්ඝ කළ යුතු ය.

8.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— 2006 අප්‍රේල් මස 04 වැනි දින ගරු කථානායකතුමා විසින් පත් කරන ලද මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවට, තමා විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු 2009 ජුනි මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මගින් නියම කර ඇති කාල සීමාව ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට නොහැකි බැවින් එම කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව අංක 96 දරන ස්ථාවර නියෝගය ප්‍රකාරව 2010 මාර්තු මස 31 වැනි දින දක්වා දීර්ඝ කළ යුතු ය.

9.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ශීඝ්‍රයෙන් ඉහළ යන රථවාහන අනතුරු පිළිබඳව කරුණු විමර්ශනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— 2007 මැයි මස 08 වැනි දින ගරු කථානායකතුමා විසින් පත් කරන ලද, ශීඝ්‍රයෙන් ඉහළ යන රථවාහන අනතුරු පිළිබඳව කරුණු විමර්ශනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවට, තමා විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු 2009 ජුනි මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මගින් නියම කර ඇති කාල සීමාව ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට නොහැකි බැවින් එම කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව අංක 96 දරන ස්ථාවර නියෝගය ප්‍රකාරව 2010 මාර්තු මස 31 වැනි දින දක්වා දීර්ඝ කළ යුතු ය.

10.

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

" බෞද්ධ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කිරීමේ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

11.

ගරු සරණ ගුණවර්ධන මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

" ටී. බී. ඒකනායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

12.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

" සමනලගිරි සතරාංග (නාඩි) වෛද්‍ය සභා සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

13.

ගරු ජයන්ත සමරවීර මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 4),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

" ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද, සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2009 දෙසැම්බර් මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

ප්‍රවාහන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 306— වැඩසටහන 02,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන හාරදහස් හත්සිය පනහකට (රු. 4,750,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | |
|---|---|---|
| ශීර්ෂය | 306 | — ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන | 02 | — සංවර්ධන වැඩසටහන |

| | | |
|---|---|---|
| මූලධන වියදම් | රු. | 4,750,000,000 |
| | රු. | 4,750,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 නොවැම්බර් මස 17 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 27 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 26 දක්වා එකතුව රු. 88,406,003,938.

*3.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 285— වැඩසටහන 01,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන පනහකට (රු. 50,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 285 | — | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන | 01 | — | මෙහෙයුම් වැඩසටහන |
| ව්‍යාපෘතිය | 01 | — | පරිපාලන හා ආයතන සේවා |
| සංවර්ධන සහනාධාර | 1504 | — | රු. 50,000,000 |
| | | | රු. 50,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 නොවැම්බර් මස 17 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 26 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 25 දක්වා එකතුව රු. 88,356,003,938.

*4.
මැතිවරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.
සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.
ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.
වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.
රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.
ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.
ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*12.
අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*13.
ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.
ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*15.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*16.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*17.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*18.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*19.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචානාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දුම්කොළ බදු පනත යටතේ වූ නියෝග,— 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 21 වැනි වගන්තිය යටතේ සිගරැට්, සුරුට්ටු, බීඩි හෝ පයිප්ප දුම්කොළ සඳහා වූ අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජූලි මස 17 වැනි දිනැති අංක 1610/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.10. 08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*29.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*30.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*31.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*32.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*33.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*34.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*35.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ අතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*36.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

37.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

39.

පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

40.

මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

41.

කම්කරු නිලධාරීන්ගේ සංගමයේ සුභසාධක අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

42.

ප්‍රේමදාස කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

43.
ශ්‍රී සුමංගල සරණසේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

44.
අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

45.
හඟුරන්කෙත මාදන්වෙල රජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

46.
බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

47.
සම් හාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

48.
ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

49.
අල්හාජ් එස්. එම්. එම්. හුසේන් පුණ්‍යාය භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

50.
මහින්දානන්ද අලුත්ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

51.
ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

52.
සමෝදා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

53.
ග්‍රාස්රූට්ස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

54.
වාරියපොල රාජමහා විහාර සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0420/'09

1\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0421/'09

2\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) ලග්ගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0422/'09

3\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0423/'09

4.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) අඹන්ගඟ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0424/'09

5.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) යටවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0425/’09

6\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) උකුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0426/’09

7\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0427/’09

8\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0428/'09

9.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) මාතලේ මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම නගර සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම නගර සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0429/'09

10.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0430/'09

11.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0446/'09

12.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහවැලි අධිකාරියට සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් සමස්ත වැව් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැව්වලට අයත් රක්ෂිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම රක්ෂිත ඉඩම් හඳුනාගැනීම සඳහා අවසන් වරට මිනුම් කටයුතු සිදු කර ඇති වර්ෂය කවරේද;

(iii) මෙම රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන් සිටීද;

(iv) එසේනම්, ඔවුන් පදිංචිව සිටින්නේ කවර හෝ නෛතික පදනමක් මතද;

(v) එසේනම්, ඒ පදනම හා කාලසීමාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0447/'09

13.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහවැලි අධිකාරියට සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් සමස්ත වැව් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැව්වලට අයත් රක්ෂිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම රක්ෂිත ඉඩම් හඳුනාගැනීම සඳහා අවසන් වරට මිනුම් කටයුතු සිදු කර ඇති වර්ෂය කවරේද;

(iii) මෙම රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන් සිටීද;

(iv) එසේනම්, ඔවුන් පදිංචිව සිටින්නේ කවර හෝ නෛතික පදනමක් මතද;

(v) එසේනම්, ඒ පදනම හා කාලසීමාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0448/'09

14.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහවැලි අධිකාරියට සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් සමස්ත වැව් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැව්වලට අයත් රක්ෂිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම රක්ෂිත ඉඩම් හඳුනාගැනීම සඳහා අවසන් වරට මිනුම් කටයුතු සිදු කර ඇති වර්ෂය කවරේද;

(iii) මෙම රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන් සිටීද;

(iv) එසේනම්, ඔවුන් පදිංචිව සිටින්නේ කවර හෝ නෛතික පදනමක් මතද;

(v) එසේනම්, ඒ පදනම හා කාලසීමාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0449/'09

15.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහවැලි අධිකාරියට සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් සමස්ත වැව් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැව්වලට අයත් රක්ෂිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම රක්ෂිත ඉඩම් හඳුනාගැනීම සඳහා අවසන් වරට මිනුම් කටයුතු සිදු කර ඇති වර්ෂය කවරේද;

(iii) මෙම රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන් සිටීද;

(iv) එසේනම්, ඔවුන් පදිංචිව සිටින්නේ කවර හෝ නෛතික පදනමක් මතද;

(v) එසේනම්, ඒ පදනම හා කාලසීමාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?